පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.10.29 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1956/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.**

2025.10.28 වන දින උදෑසන කාලයේ ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 02 ග්‍රෑම් 523ක් සන්තකයේ තබාගෙන තායිලන්තයේ බැංකොක් සිට ගුවන් මගින් මෙරටට පැමිණි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. සම්භාහන මධ්‍යස්ථාන මුවාවෙන් පවත්වා ගෙන ගිය ගණිකා නිවාස දෙකක් වටලා සැකකරුවෙකු හා සැකකාරියන් පස් දෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.10.28 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන හා ගල්කිස්ස හන්දිය ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම් 02ක් සිදු කර සම්භාහන මධ්‍යස්ථාන මුවාවෙන් පවත්වා ගෙන ගිය ගණිකා නිවාස 02ක් වටලා එහි කළමණාකාරිණියක් හා කළමණාකරුවෙකුද ගණිකා සේවය සඳහා රැඳී සිටි සැකකාරියන් සිව් දෙනෙකුද අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 46 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරියන් අවුරුදු 30, 34, 41, 46 හා 51 යන වයස්වල පසුවන අම්පාර, වැලිඔය, මැදිරිගිරිය හා රත්මලාන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දිය අනතුරකින් පුද්ගලයෙකු බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය ඒත්තුකාල.

2025.10.28 වන දින සවස් කාලයේදී ඒත්තුකාල පොලිස් වසමේ ඒත්තුකාල වෙරළ තීරයේ දියනෑමට ගිය පුද්ගලයින් තිදෙනෙකුගෙන් එක් අයෙකු දිය වැලකට හසුව මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒත්තුකාල ඒකකයට අනුයුක්ත පොලිස් සැරයන් 40868 සිල්වා, පොලිස් කොස්තාපල් 100082 මදුරංග, පොලිස් කොස්තාපල් 102653 ශරෝන්, පොලිස් කොස්තාපල් 102708 මදුසංක හා පොලිස් කොස්තාපල් 105320 විජේසිංහ යන නිලධාරින් විසින් එම පුද්ගලයා බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දී ඇත.

**මෙලෙස අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 30 ක් වන අකුරැස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

## 04. සැකකටයුතු මරණයක් - නුවරඑළිය පොලිස් වසම.

2025.10.28 වන දින රාත්‍රී කාලයේ නුවරඑළිය පොලිස් වසමේ කිකිළියාමාන රක්ෂිතයේ සැකකටයුතු ලෙස පුද්ගලයෙකු මියගොස් ඇති බවට නුවරඑළිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 27ක් වූ ශාන්තිපුර, නුවරඑළිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2025.10.08 වන දින මරණකරු අතුරුදන්ව ඇති බවට නුවරඑළිය පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ලැබී ඇති අතර මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ ඇත. මෙය ස්වාභාවික මරණයක්ද නැතහොත් මනුෂ්‍ය ඝාතනයක්ද යන්න සම්බන්ධව නුවරඑළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - වත්තල පොලිස් වසම.

2025.10.28 වන දින සවස් කාලයේ වත්තල පොලිස් වසමේ හැඳල පල්ලියවත්ත වෙරළ තීරයේ නාඳුනන පිරිමි මෘත ශරීරයක් ඇති බවට වත්තල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර කළු පැහැති ටී ෂර්ටයක් හා නිල් පැහැති කොට ඩෙනිම් කලිසමක් හැඳ සිට ඇති අතර දකුණු අතෙහි ලියවැලක් සහිත පච්චයක්ද, වම් අතෙහි ඉංග්‍රීසි එන් අකුර සහිත පච්චයක්ද කොටා ඇත.**

මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණයෙන් පසු රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - කෑගල්ල පොලිස් වසම.

2025.10.28 වන දින දහවල් කාලයේ කෑගල්ල පොලිස් වසමේ කොළඹ මහනුවර මාර්ගයේ වලකඩයාව ප්‍රදේශයේදී කෑගල්ල දෙස සිට මාවනැල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන බැම්මක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු හා පිටුපස ගමන් කල රියදුරුගේ බිරිඳ හා වයස අවුරුදු 07ක් වන දියණිය මාවනැල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු රියදුරු කෑගල්ල රෝහල වෙත මාරු කර යවා ප්‍රථිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ මාකෙහෙල්වල, මාවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කෑගල්ල රෝහලේ මෘත ශරීරාගරයේ තැන්පත් කර ඇති අතර කෑගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - වත්තල පොලිස් වසම.

2025.10.28 වන දින උදෑසන කාලයේ වත්තල පොලිස් වසමේ පල්ලියවත්ත ප්‍රීතිපුර මාර්ගයේ පල්ලියවත්ත ප්‍රදේශයේදී ප්‍රීතිපුර දෙසට ධාවනය වූ ලොරි රථයක් එම දිශාවටම මාර්ගය අයිනේ ගමන් කරමින් සිටි පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික පුද්ගලයා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 54 ක් වූ මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - බිබිල පොලිස් වසම.

2025.10.28 වන දින රාත්‍රී කාලයේ බිබිල පොලිස් වසමේ බිබිල මොණරාගල මාර්ගයේ වාගොල්ලවත්ත ප්‍රදේශයේදී බිබිල දෙස සිට මොණරාගල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් විරුද්ධ දෙසින් පැමිණි කැබ් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු හා පිටුපස ගමන් ගත් කාන්තාවක් තුවාල ලබා බිබිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ත්‍රීරෝද රථයේ පිටුපස ගමන් ගත් කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 44 ක් වූ බිබිල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය බිබිල රෝහලේ මෘත ශරීරාගරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ කැබ් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බිබිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**